# වීථි රේඛා / ගොඩනැගිලි සීමා සහතිකය නිකුත් කිරීම

කිසියම් ඉඩමක් පිහිටා ඇති පළාත් පාලන ආයතනයේ බලයලත් නිලධාරියකු විසින් මිනින්දෝරු පිඹුරු පතක සටහන් කර දක්වන මායිම වීථි රේඛාව නම් වේ. මෙම වීථි රේඛාවේ සිට ඉඩම මායිම් ව ඇති පාර දක්වා කොටස, ඉදිරියේ යම් දිනක ඒ පාර පළල් කිරීම සඳහා අත්පත් කර ගැනීමට නියමිත ය. එම නිසා එම සීමාවට අයත් කොටසේ කිසිදු ඉදිකිරීමකට ඉඩ දෙනු නොලැබේ.

ප්‍රාදේශිය සභා මාර්ගයක මධ්‍ය රේඛාවේ සිට දෙපස ට අඩි විසි පහක (මීටර් 7.62) දුර ගොඩනැගිලි සීමාව වේ. මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගයක හෝ පළාත් බඳ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගයක ගොඩනැගිලි සීමාව එම ආයතන විසින් ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රමාණය වේ.

කිසියම් ගොඩනැගිලි සීමාවක් හෝ වීථි රේඛා සීමාවක් තුළ කිසිදු ඉදිකිරීමකට ඉඩ දෙනු නොලැබේ.

**01**

මුලින් ම ඉල්ලුම් පත්‍රයක් ලබා ගන්න.

එය පළාත් පාලන ආයතනයේ පෙරටු කාර්යාලයෙන් ලබා ගත හැකි ය.

එසේම සභාවේ වෙබ් අඩවියෙන් ද බාගත කළ හැකි ය.

**02**

මෙම ඉල්ලුම්පත පැහැදිලිව හා නිවැරදිව සම්පූර්ණ කර ඉඩමේ මිනින්දෝරු සැලැස්මේ පිටපතක් සමඟ පෙරටු කාර්යාලයට බාර දෙන්න.

**03**

එය බාර දුන් අවස්ථාවේ දී ම, ඉඩම මායිම් වී ඇති පාරවල් ඉල්ලුම්කරු විමසීමෙන් හඳුනා ගන්නා අතර අපැහැදිලි අවස්ථාවක තාක්ෂණ නිලධාරියාගේ සහාය ලබා ගනු ඇත

**04**

අදාළ දේපළ සම්බන්ධව සභාවට යම් මුදලක් අය වීමට ඇත්නම්, එය සහ සහතිකය නිකුත් කිරීමේ ගාස්තුව ඒ අවස්ථාවේ දී ම ගෙවා ලදුපතක් ලබා ගන්න.

**05**

වීථි රේඛා නියම කර ඇති විටක, ඉල්ලුම් පත්‍රය භාර ගෙන දින තුනක් ඇතුළත සහතිකය නිකුත් කරන අතර, වීථි රේඛා නියම් කර නැති විට, ඉල්ලුම් පත්‍රය බාර ගත් දින ම ගොඩනැගිලි සීමාව පිළිබඳ සහතිකය නිකුත් කරනු ලැබේ.

**06**

ඉල්ලුම්කරු දේපළෙහි අයිතිකරු නොවන විට, සහතිකය නිකුත් කිරීම සඳහා අයිතිකරු විසින් ඇමුණුම 02 හි ඉල්ලුම් පත්‍රයේ 07 වන ඡේදයේ සඳහන් එකඟතාව පළ කර තිබීම අනිවාර්ය වේ.

**07**

සභාව විසින් වීථි රේඛා නියම කර ඇත්නම්, සභාවේ තාක්ෂණ නිලධාරියා විසින් පිඹුරු පතෙහි වීථි රේඛාව සලකුණු කර ඔබට බාර දෙනු ඇත. ඇමුණුම 1 හි ගොඩනැගිලි සීමාව ද වෙනම සඳහන් කරනු ඇත.

**08**

සභාව විසින් වීථි රේඛා නියම කර නොමැති විට ඇමුණුම 1 හි ගොඩනැගිලි සීමාව සඳහන් කර දෙනු ලැබේ.

